පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව- සතිපාසල

School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

සතිය -

විෂය -ඉතිහාසය

Prepared by - කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

ශ්‍රේණිය :- 11

සැලකිය යුතුය

- පළමු කොටසේ පළමුවන ප්‍රශ්නය අනිවාර්යය වේ.
- දෙවන කොටසේ ප්‍රශ්න හතරකට ද තුන්වෙනි කොටසේ එක් ප්‍රශ්නයකට ද පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 06 කි.

පළවෙන කොටස

01.(අ) පහත 1 යටතේ දක්වා ඇති ස්ථාන සියල්ල ලංකා සිතියමක ද 11 යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ලෝක සිතියමක ද ලකුණු කරන්න.

(1)කලාඔය, ගිම්හතිත්ත, කල්පිටිය, සේරුවිල, රන්දෙණිගල, ගල්ඔය, ඉරණමඩු, අගලවත්ත, මාතර, දීඝවාපී, මිනිහාගල්කන්ද, උරුවෙල.

11) වැනිසිය,කළු මුහුද ,හිරෝෂිමා  කුණාටු තුඩුව  ලංඩන්, සුමාත්‍රා.

ආ) පහත a b c d යටතේ දී ඇති ප්‍රකාශවලට ගැලපෙන පිළිතුරු පිළිවෙලින් ලියන්න.

A මෙරට ප්‍රථම වරට විශාල ප්‍රමාණයේ වැව් ඉදිකල රජු

B.වෙර යොදා බලයක් යෙදීමෙන් ගල් පතුරු ගලවා මෙවලම් තැනීමේ ක්‍රමය

C. ඉංග්‍රීසීන්ට උඩරට යටත් කර ගැනීමට උපක්‍රමශීලීව ක්‍රියා කළ නිලධාරියා.

D.දකුණු ඉන්දියාවෙන් මෙහි පැමිණ වැටුපට සේවය කල ආරක්ෂිත හමුදාව.

11 කොටස

02.1)ශ්‍රී ලංකාව ජනාවාස කළ මානව වර්ගයා නම් කර ඔවුන්ගේ යැපුම් මාර්ග දෙකක් හඳුන්වන්න.

11).පහතරට අර්ධ ශුෂ්ක කලාපයේ ප්‍රාග් ඓතිහාසික යුගය පිළිබඳව කැණීම් කළ ස්ථාන හතරක් නම් කරන්න.

111) ගල් යුගයේ තාක්ෂණය පිළිබඳ ව ගල් මෙවලම් වලින් හෙළිවන තොරතුරු මොනවාදැයි උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

4. පූර්ව ඓතිහාසික යුගයේ පැවැති තාක්ෂණය පිළිබඳව උදාහරණ තුනක් යටතේ විස්තර කරන්න.

03.1) ගමික සතු කාර්‍යයන් තුනක් සඳහන් කරන්න.

11). වැව් පද්ධතියක් ඉදි කිරීමෙන් බලාපොරොත්තු වූ අරමුණ දෙකක් සඳහන් කරන්න.

111). පණ්ඩුකාභය රජුගේ ශ්‍රේෂ්ඨත්වය කරුණු දෙකක් යටතේ විස්තර කරන්න.

4) පලවෙනි විජයබාහු රජු මෙරට එක්සේසත් කළ ශ්‍රේෂ්ඨතම රජ කෙනෙකු වශයෙන් ඇති වැදගත් කම කරුණු දෙකක් යටතේ පැහැදිලි කරන්න.

04.1)පහත a b c යටතේ දී ඇති ප්‍රකාශවලට ගැළපෙන පිළිතුරු ලියන්න.

A. දෙවන පරාක්‍රමබාහු රජුට ලැබුණු උපාධි නාමය.

B. සිව්වවූ විජයබාහු හැඳින්වූ අනෙකුත් නාමයෙන්

C. ගම්පල යුගයේ ගම්පොල විසූ ප්‍රභූ පවුලක්

11) කුරුණෑගල යුගයේ ලියවුණු ග්‍රන්ථ හතරක් සඳහන් කරන්න.

11). ගම්පල සහ කෝට්ටේ යුගයන්හි යාපනයේ රාජධානියේ තත්ත්වය පැහැදිලි කරන්න.

4.) රාජධානි නිරිත දිගට විතැන් වීමේදී ආර්ථිකය වූ වෙනස්කම් දෙකක් පැහැදිලි කරන්න.

05.1) උඩරට රාජධානිය හැඳින්වූ නම් තුනක් ලියන්න.

11) උඩරට රාජ්‍යය සමඟ පැවැති ඒ බී සී ඩී යටතේ සඳහන් යුද්ධ මෙහෙය වූ පෘතුගීසි පාලකයන්ගේ නම් අනුපිළිවලින් ලියා දක්වන්න.

A. දන්තුරේ

B.බලන

C.රන්දෙනිවල

D.ගන්නෝරුව

111.)පලවෙනි විමලධර්ම සූරිය රජු තම රාජ්‍ය උරුමය තහවුරු කර ගැනීමට අනුගමනය කළ උපක්‍රම මොනවාදැයි පැහැදිලි කරන්න.

4). මහනුවර රාජධානියේ ගැමි සමාජයේ දක්නට ලැබුණු විශේෂ ලක්ෂණ දෙකක් කෙටියෙන් විස්තර කරන්න.

06.1)මිෂනාරීන් තම ආගම් ප්‍රචාරණයේ දී යොදාගත් මාධ්‍ය තුනක් සඳහන් කරන්න.

11)පහත a b c d යටතේ ඇති තොරතුරුවලට අදාළ පුද්ගලයන් පිළිවෙලින් නම් කරන්න

A.ලංකෝපකාර මුද්‍රණාලයේ පිහිටවීම

B.මද්‍රාසා මුස්ලිම් පාසල් ආගමික පාසල් ප්‍රතිසංවිධාන

C.උදයභානු පුවත්පත ඇරඹීම.

D. 1883 ඊජිප්තුවේ සිට පැමිණි ඉස්ලාම් පුනරුදය වෙනුවෙන් කැපවී කටයුතු කිරීම.

111) විදේශිකයකු වූ ඕල්කට්තුමා මෙරට බෞද්ධ පුනර්ජීවනයට දායක වූ ආකාරය කරුණු දෙකක් යටතේ පැහැදිලි කරන්න.

4) මෙරට බෞද්ධ පූජනීය ස්ථාන රැක ගැනීමට විදේශීය හා දේශීය උගතුන් ක්‍රියා කළ ආකාරය පෙන්වා දෙන්න.

07.1)1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අඩංගු ඡන්ද විමසීම් ක්‍රම තුන නම් කරන්න.

11) පහත a b c d යටතේ ඇති ප්‍රකාශ වලට අදාළ පිළිතුරු පිළිවලින් ලියන්න.

A.1972 ව්‍යවස්ථාවෙන් ව්‍යවස්තාදායක සභාව හැඳින්වූ නම.

B. මෙරට ප්‍රථම විධායක ජනාධිපති.

C.මෙරට ප්‍රථම මහවැලි සංවර්ධන ඇමැති

D.මෙරට මුල්ම අගමැතිනිය.

111.A.ප්‍රථම බහුකාර්ය යෝජනා ක්‍රමය

B. බහුකාර්ය යෝජනා ක්‍රමයක කාර්යය කෙටියෙන් විස්තර කරන්න

4). 1970- 77 කාලය තුළ රජයේ අනුගමනය කළ ආයාත ආදේශන ප්‍රතිපත්තිය කෙටියෙන් පහදන්න.

111 කොටස

08.1)බ්‍රිතාන්‍යයේ කාර්මික විප්ලවය හේතු තුනක් නම් කරන්න.

11)පහත ABCD යටතේ දක්වා ඇති නිපැයුම් හා සම්බන්ධ පුද්ගලයන් නම් කරන්න.

A. රෝලර් යන්ත්‍රය

B. ජෙනි යන්ත්‍රය

Cආරක්ෂක ලාම්පුව

D දුම් බෝට්ටුව

111) කාර්මික විප්ලවය ලෝක ආර්ථික ක්ෂේත්‍රයේ ඇති කළ වෙනස්කම් උදාහරණ සහිතව පැහැදිලි කරන්න.
4.කාර්මික විප්ලවය ශ්‍රී ලංකාවේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ දියුනුවට හේතු වූ ආකාරය විස්තර කරන්න.

09.1) පළමු ලෝක යුද්ධයට සම්බන්ධ මධ්‍යම බලවතුන් තුන්දෙනෙකු නම් කරන්න.

11) පහත ABCD යටතේ සඳහන් පුද්ගලයන් සම්බන්ධ රටවල් අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A.ක්ලෙමන්ෂෝ

B. වුඩ්රෝ විල්සන්

C. ලොයිඩ් ජෝර්ජ්

D.විටෝරියෝ ඔලැන්ඩෝ

111) A. පළමු ලෝක යුද්ධයෙන් වරදකරුවෙකුවූ ජර්මනියට දඬුවම් දීමට අත්සන් කළ ගිවිසුම කුමක්ද?
B.ජර්මනියට ලබා දුන් දඬුවම් තුනක් සඳහන් කරන්න.

4)A.ජාතීන්ගේ සංගමය බිහිවීමට පුරෝගාමී වුයේ කවුද ?

B.එම සංගමයේ ප්‍රධාන අරමුණු පැහැදිලි කරන්න.